# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ඇබෑර්තු

## සහකාර ලේඛකාධිකාරී තනතුර

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා යෝග්‍ය සුදුසුකම් සහිත පුද්ගලයන් වෙතින් 2025.04.01 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණකාලීන නිලධාරියෙකු වනු ඇත.

**සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් සහ පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් මාස්ටර්ස් (Masters) තලයේ පශ්චාත් උපාධියක් සමඟ පළමු උපාධිය ලබාගැනීමෙන් පසු වසර පහළොවකට (15) නොඅඩු පරිපාලන පළපුරුද්දක් තිබිය යුතුය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ලේඛකාධිකාරීවරු ලෙස පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

වෛද්‍ය සභාවෙහි සප්තවාර්ෂික නිවාඩු (Sabbaticai Leave) ස්ථානගත කිරීම් සඳහා තෝරා ගන්නා අපේක්ෂකයින්ද සලකා බලනු ලැබේ.

**"පරිපාලන පළපුරුද්ද"** යනු පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් පළමු උපාධිය ලබාගැනීමෙන් අනතුරුව, රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ සංවිධානයක, මානව සම්පත් කළමනාකරණය හෝ සාමාන්‍ය පරිපාලනය හෝ සමස්ත පරිපාලනය සම්බන්ධ පරිපාලන තලයේ පූර්ණකාලීන තනතුරක පළපුරද්ද ලබා තිබීමයි. මූල්‍ය/ ඉංජිනේරු හෝ වෙනත් තාක්ෂණික ක්ෂේත්‍රයක ලබාගත් පළපුරුද්ද මේ සඳහා සලකා නොබැලේ.

**වයස :** අදාළ රාජ්‍ය චක්‍රලේඛ අනුව තීරණය වේ.

**වැටුප :** අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව සාකච්ඡා කළ හැක.

විශ්වවිද්‍යාල පද්ධතියේ සහකාර ලේඛකාධිකාරීවරයෙකුගේ ආරම්භක වැටුප අවම වැටුප වන අතර, එය සාකච්ඡා කළ හැක.

**වෙනත් ප්‍රතිලාභ :**

- අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් 10% ක් සහ සේවා යෝජකයා විසින් 15% ක දායකත්වය
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා සේවායෝජකයා විසින් 3%ක දායකත්වය

**රැකියා කොන්දේසි :** අවසන් දෙවන වාරයක් සඳහා නැවත පත්කිරීමේ හැකියාව ඇතිව, වසර දෙකක කාලයක් සඳහා පූර්ණකාලීන කොන්ත්‍රාත් පදනම මත පත්වීම සිදු කෙරේ.

**කාර්ය සහ වගකීම්**

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරීවරයාට සහය වීම
- වෛද්‍ය සභාවේ කළමනාකරණ කටයුතු සඳහා සහය වීම සහ වෛද්‍ය සභාව වෙනුවෙන් නිවේදන නිකුත් කිරීම සහ සියලුම ලිපි හුවමාරු කටයුතු සිදු කිරීම
- වෛද්‍ය සභාවේ ලේඛන පවත්වා ගැනීමට සහය වීම.
- සභාවේ වාර්තා සටහන්කොට පවත්වාගෙන යාම
- වෛද්‍ය සභාවේ සියලුම පරිපාලන තීරණ ක්‍රියාත්මක කිරීමට සහය වීම සහ
- ලේඛකාධිකාරීවරයා/ වෛද්‍ය සභාව විසින් පවරනු ලබන වෙනත් සියලුම රාජකාරී ඉටු කිරීම.

**අයදුම්පත් එවන ආකාරය**

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ ජීවදත්ත පත්‍රයක් සමඟ තනතුර සඳහා අයදුම් කිරීමට තම අභිප්‍රාය දක්වෙන ආවරණ ලිපියක් සහිතව අයදුම්පත් 2025.04.01 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ **registrar@slmc.gov.lk** වෙත ඊමේල් මඟින් එවීම කළ යුතුය.

**වෛද්‍ය එච්.ඩී.බී. හේරත්**
**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**31, නොරිස් කැනල් පාර, කොළඹ 10.**
**registrar@slmc.gov.lk**

2025.03.16